ස.සේ.කො.චක්‍රලේඛ අංක : 7/99 (i)

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2021.10.13

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු.

පිළිකා රෝගය වැළදීම හේතුවෙන් ලබා දෙන සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු කාල සීමාව දීර්ඝ කිරීම.

වයඹ පළාත් සමුපකාර සමිති සේවකයින් සම්බන්ධයෙන් විශේෂිත රෝග සඳහා නිවාඩු අනුමත කිරීමට අදාල විධි විධාන ඇතුළත් කරමින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක : 7/99 හි 01 ජේදයෙහි සඳහන් අඩ වැටුප් සහිත නිවාඩු කාලය ගණනය කිරීමේදී ,නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය රෙගුලාසි/ චක්‍රලේඛ යටතේ වන විධි විධාන අදාළ කර ගත යුතු බවටත්, එහි අංක 04 යටතේ වන III ජේදය ,පහත පරිදි සංශෝධනය කිරීමට 2021.09.16 දිනැති කොමිෂන් සභාව නියෝග කරයි.

04 - III පිළිකා රෝගය පිළිබඳව වෛද්‍ය මණ්ඩලයක/විශේෂඥ වෛද්‍යවරයෙකුගේ වෛද්‍ය සහතිකයක් මඟින් නිවාඩු අවශ්‍යතාවය විධිමත් පරිදි තහවුරු කරන අවස්ථාවක පිළිකා රෝගයට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලබාදිය හැකිය.

මාස 06ක විශේෂ නිවාඩුව අවසන් වූ පසු තව දුරටත් නිවාඩු අවශ්‍ය බවට වෛද්‍ය මණ්ඩලය/විශේෂඥ වෛද්‍යවරයෙකු නිර්දේශ කරන්නේ නම් මාස 03කට නොවැඩි අමතර නිවාඩු කාලයක් සම්පූර්ණ වැටුප් සහිතව ලබා දිය හැකිය.

02.උක්ත චක්‍රලේඛයේ පිළිකා රෝගය සම්බන්ධව දක්වා ඇති අනෙකුත් විධි විධාන තව දුරටත් බලාත්මක වෙන බවට වැඩි දුරටත් දන්වමි.

03.මෙම විධි විධාන 2021.09.16 දින සිට බලාත්මක වේ.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව
(වයඹ)

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පළාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව - දැ.ගැ.පි.- අ.ක.ස.